# ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය
# කැලණිය විශ්වවිද්‍යාලය
# වාර්ෂික වාර්තාව 2013

# கம்பஹா விக்ரமாரச்சி ஆயுர்வேத கல்வி நிறுவகம்
# களனிப் பல்கலைக்கழகம்
# 2013 ஆம் ஆண்டுக்கான ஆண்டறிக்கை

# Gampaha Wickramarachchi Ayurveda Institute

# University of Kelaniya

# Yakkala

# Annual Report – 2013

# වාර්ෂික වාර්තාව

# 2013

## ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය
## කැලණිය විශ්වවිද්‍යාලය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1995 මාර්තු මස 13 වන දින ප්‍රකාශයට පත් කරන ලද අංක 862/8 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24 අ (2) හා 24 (ආ) යටතේ 1995 අංක 01 දරන ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතන නියමාවලිය ප්‍රකාශයට පත් කර තිබේ. එමගින් ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත උසස් අධ්‍යාපන ආයතනයක් ලෙස පිහිටුවා ඇත.

එකී නියමාවලියේ ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී යන අධ්‍යයන වර්ෂ පහකින් සමන්විත උපාධි පාඨමාලාවක් පවත්වාගෙන යාම ප්‍රධාන පරමාර්ථය වී ඇත.

ඒ අනුව 1995 මාර්තු 01 දින සිට උසස් අධ්‍යාපන ආයතනයක් වශයෙන් පවත්වාගෙන යන මෙම ආයතනයේ 2013 වර්ෂය සඳහා වූ ආයතනික කටයුතු හා සංවර්ධනය ඇතුළත් වාර්ෂික වාර්තාව, අවසාන ගිණුම් වාර්තාව හා 2013 වර්ෂය සඳහා මෙම ආයතනය සම්බන්ධයෙන් වූ රජයේ විගණකාධිපති විසින් ලබා දී ඇති වාර්තාව මෙයින් ඉදිරිපත් කරමි.

මහාචාර්ය ජනිතා ඒ ලියනගේ.
අධ්‍යක්ෂ

# ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය
## අධ්‍යක්ෂගේ වාර්තාව

ආයතනයේ දැක්ම හා මෙහෙවර ළඟා කර ගැනීමට සකස් කරන ලද 2013 - 2017 දක්වා වන සංයුක්ත සැලැස්ම මෙම ආයතනයේ 2013.07.19 දින පැවැති 206 වන කළමනාකරණ මණ්ඩලයේ දී අනුමත කර තිබේ.

ඒ අනුව උපාධි අපේක්ෂක සිසුන්ගේ සහ කාර්ය මණ්ඩලයේ කාර්ය සාධනය අගය කළ යුතු මට්ටමකට ළඟා කර ගැනීමට හැකි වූ බව සතුටින් සඳහන් කරමු.

සංයුක්ත සැලැස්මේ අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීමේ දී නොවැළැක්විය හැකි හේතුන් හා අනපේක්ෂිත බාධාවන් නිසා ඇතැම් ඉලක්ක ළඟා කර ගැනීමට අපොහොසත් වූ බව කිව යුතුය.

සංයුක්ත සැලැස්ම සංශෝධනය කර එමගින් සංයුක්ත සැලැස්මේ සඳහන් ඉලක්ක යම් ප්‍රමාණයකින් ළඟා කර ගත හැකි වේ යයි මාගේ විශ්වාසය යි.

මහාචාර්ය ජනිතා ඒ. ලියනගේ.
අධ්‍යක්ෂ.

# පටුන


| කාරණය | | පිටු අංක |
|---|---|---|
| 01 | ආයතනයේ දැක්ම | 01 |
| 02 | මෙහෙවර හා ප්‍රකාශය | 02 |
| 03 | අධ්‍යක්ෂ තුමියගේ පණිවුඩය | 03 |
| 04 | සම්පත් හා ශිෂ්‍යයන් පිළිබඳ විස්තර | 04 |
| 05 | දේශීය සිසුන් පිළිබඳ විස්තර | 04 |
| 06 | විදේශීය සිසුන් පිළිබඳ විස්තර | 04 |
| 07 | අධ්‍යයන කාර්ය මණ්ඩලයේ විස්තර | 05-07 |
| 08 | අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ විස්තර | 08 |
| 09 | පර්යේෂණ, නව සොයා ගැනීම් සහ ප්‍රකාශන පිළිබඳ විස්තර | 08-09 |
| 10 | වැඩ සටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු පිළිබඳ විස්තර | 09 |
| 11 | සම්මාන ලැබීම් පිළිබඳ විස්තර | 10 |
| 12 | ආරම්භ කරන ලද නව පාඨමාලාවල විස්තර | 10 |
| 13 | පුනරාවර්ථන වියදම් විස්තර | 11 |
| 14 | ප්‍රාග්ධන වියදම් විස්තර | 11 |
| 15 | ව්‍යාපෘති පිළිබඳ විස්තර (දේශීය විදේශීය මූල්‍ය දායකත්වය) | 11-12 |
| 16 | ව්‍යාපෘති වියදම් පිළිබඳ විස්තර (දේශීය විදේශීය මූල්‍ය දායකත්වය) | 12 |
| 17 | මූල්‍ය තත්වයේ ප්‍රගතිය පිළිබඳ විස්තර (වියදම්) | 13 |
| 18 | මූල්‍ය තත්වයේ ප්‍රගතිය පිළිබඳ විස්තර ( අභ්‍යන්තර ආදායම්) | 13 |
| 19 | මූල්‍ය ක්‍රියාකාරිත්ව විශ්ලේෂණය | 13 |
| 20 | යටිතල පහසුකම් සඳහා 2013 වර්ෂය තුළ ලැබීම් | 14 |

| | | |
|---|---|---|
| 21 | වෙනත් විස්තර | 14 |
| | 21.1 පුස්තකාලය | 14 |
| | 21.2 පරිගණක අංශය | 14 |
| | 21.3 යටිතළ පහසුකම් සංවර්ධනය | 14 |
| 22. | අධ්‍යක්ෂ වාර්තාව | 15-16 |
| 23. | 2013.12.31 දිනට මූල්‍ය තත්ත්වය දැක්වෙන ප්‍රකාශනය | 17 |
| 24. | 2013.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් සහ වියදම් පිළිබඳ ප්‍රකාශනය. | 18 |
| 25 | විගණකාධිපති වාර්තාව | 19-27 |
| 26 | විගණකාධිපති වාර්තාවට පිළිතුරු | 28-31 |

1. **ආයතනයේ දැක්ම :**

**දැක්ම**

කුසලතා පූර්ණ උපාධිධාරීන් බිහි කිරීම මගින් ආයුර්වේද අධ්‍යයන පිළිබඳ විශිෂ්ඨ මධ්‍යස්ථානය බවට පත් වීම.

## 2. මෙහෙවර ප්‍රකාශය

# මෙහෙවර

ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ මෙහෙවර වනුයේ,ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රයේ විද්‍යාත්මක දැනුම හා අවබෝධය වර්ධනය කිරීම සහ දැනුම ව්‍යාප්ත කිරීම සඳහා පහත දැක්වෙන අරමුණු හා ක්‍රමවේදයක් ක්‍රියාවට නැංවීම ය.

" මෙම ආයතනයේ අධ්‍යාපනය ලබන සිසුන් හැම අතින් ම සංවර්ධනය කිරීම සඳහා සුදුසු වාතාවරණයක් බිහි කිරීම, ආයුර්වේද වෛද්‍ය අධ්‍යාපනයේ ප්‍රායෝගික සහ පර්යේෂණ දියුණු කිරීම සඳහා සුදුසු පරිසරයක් ගොඩනැගීම, ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ අවශ්‍යතාවන්ට සරිලන නවීන ඉගැන්වීම් සහ පුහුණුවීම් තුළින් දැනුම ළඟා කර ගැනීම පිණිස ප්‍රායෝගික පුහුණුවීම්වලට පදනම් වන පරිසරයක් ගොඩනැගීම, පවත්නා ආයුර්වේද වෛද්‍යවේදී සහ ශල්‍යවේදී උපාධි පාඨමාලාවේ ව්‍යුහාත්මක වෙනසක් ඇති කරමින් ශිෂ්‍ය සංඛ්‍යාව ඉහළ දැමීම සඳහා සැලසුම් සකස් කිරීම, ශ්‍රී ලංකාවේ සහ දේශයෙන් පිටත සෞඛ්‍ය ක්ෂේත්‍ර සම්බන්ධ කටයුතුවල නියැලී සිටින ආයතන සමඟ අන්තර් සම්බන්ධතාවන් ගොඩනැංවීම, අවශ්‍ය සුදුසුකම් හා උනන්දුවක් සහිත මානව සම්පත් කණ්ඩායමක් ආයතනය තුළ බිහි කිරීම "

## 3. අධ්‍යක්ෂතුමියගේ පණිවුඩය :

### අ. හැඳින්වීම

ආයතනයේ දක්ම හා මෙහෙවර ළඟා කර ගැනීමට සකස් කරන ලද 2013 - 2017 දක්වා වන සංයුක්ත සැලැස්ම මෙම ආයතනයේ 2013.07.19 දින පැවැති 206 වන කළමනාකරණ මණ්ඩලය විසින් අනුමත කර තිබේ.

### ආ. ජයග්‍රහණ

උපාධි අපේක්ෂක සිසුන්ගේ සහ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ කාර්ය සාධනය අගය කළ යුතු මට්ටමකට ළඟා කර ගැනීමට හැකි වූ බව සතුටින් සඳහන් කරමු.

### ඇ. අඩුපාඩු

සංයුක්ත සැලැස්මේ අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීමේ දී නොවැළැක්විය හැකි හේතූන් හා අනපේක්ෂිත බාධාවන් නිසා ඇතැම් ඉලක්ක ළඟා කර ගැනීමට අපොහොසත් වූ බව කිව යුතු ය.

### ඈ. අනාගත සැලසුම්

සංයුක්ත සැලැස්ම සංශෝධනය කරනු ලැබූ අතර එමගින් සංයුක්ත සැලැස්මේ සඳහන් ඉලක්ක යම් ප්‍රමාණයකින් ඉදිරි වර්ෂයේ දී ළඟා කර ගත හැකි වේ යයි මාගේ විශ්වාසය යි.

විෂය නිර්දේශ සංශෝධනය කිරීමේ කටයුතු පළමු සහ දෙවන කාර්තුවලදී ක්‍රියාවට නැංවූ අතර 2010/2011 අධ්‍යයන වසරේ ප්‍රථම වසර සිසුන් සඳහා නව විෂය නිර්දේශය අනුව දේශන ආරම්භ කිරීමට හැකි විය.

විද්‍යායතනයට ප්‍රධාන අඩුපාඩුවක්ව පවතින විදුලි ජනක යන්ත්‍රය මිල දී ගැනීම සඳහා මූලික කටයුතු කරනු ලැබූ අතර 2013 වසරේදී නව විදුලි ජනක යන්ත්‍රය ස්ථාපනය කිරීමට හැකි වෙතැයි අපේක්ෂා කරමි.

ආයතනය සඳහා පවතින භූමි ප්‍රමාණය ප්‍රමාණවත් නොවන බැවින් ආයතනය වටා ඇති මුඩුබිම් අත්පත් කර ගැනීම සඳහා කරනු ලැබූ ඉල්ලීමට අදාළ වැඩ කටයුතු කාර්ය ඉටු කර ගන්නා තෙක් ඉදිරියට ගෙන යාමට අපේක්ෂා කරමි.

4. සම්පත් සහ ශිෂ්‍යයන් පිළිබඳ විස්තර :

| ආයතනය | පාඨමාලාව | මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | මුළු අධ්‍යයන කාර්ය මණ්ඩලය | මුළු අනධ්‍යයන කාර්ය මණ්ඩලය |
|---|---|---|---|---|
| ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය | ආයුර්වේද වෛද්‍යවේදී සහ ශල්‍යවේදී උපාධිය (බී.ඒ.එම්.එස්.) | 407 | | |
| මුළු ගණන | | 407 | | |

5. දේශීය සිසුන් පිළිබඳ විස්තර :

| ආයතනය | පාඨමාලාව | මාධ්‍යය | බඳවා ගැනීම 2013 | පළමු වසර සිසුන් | 2 වන වසර සිසුන් | 3 වන වසර සිසුන් | 4 වන වසර සිසුන් | 5 වන වසර සිසුන් | උපාධිය ලබාගත් මුළු ගණන |
|---|---|---|---|---|---|---|---|---|---|
| ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය | . (බී.ඒ.එම්.එස්.) | ඉංග්‍රීසි | 120 | 96 | 83 | - | - | - | 70 |
| | | සිංහල | | | | 95 | 83 | 50 | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| මුළු ගණන | | | | 96 | 83 | 95 | 83 | 50 | 70 |

6. විදේශීය සිසුන් පිළිබඳ විස්තර : නැත.

| ආයතනය | පාඨමාලාව | මාධ්‍යය | බඳවා ගැනීම | පළමු වසර සිසුන් | 2 වන වසර සිසුන් | 3 වන වසර සිසුන් | 4 වන වසර සිසුන් | උපාධිය ලබාගත් මුළු ගණන |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| මුළු ගණන | | | | | | | | |

7. අධ්‍යයන කාර්ය මණ්ඩලයේ විස්තර :

| ආයතනය | විෂය | මාධ්‍යය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | මහාචාර්ය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | කථිකාචාර්ය | සහකාර කථිකාචාර්ය | උපදේශක - වරුන් |
|---|---|---|---|---|---|---|---|---|
| ශල්‍ය ශාලක්‍ය | ශල්‍ය | සිංහල ඉංග්‍රීසි | - | - | 01 | - | - | - |
| | ශාලක්‍ය | සිංහල | - | ආචාර්ය 01 | - | - | ආධුනික01 | - |
| කෞමාර භෘත්‍ය හා ස්ත්‍රී රෝග | ස්ත්‍රීරෝග | සිංහල | - | - | 02 | - | ආධුනික .03 | ප්‍රදර්ශක 01 |
| | බාලරෝග | සිංහල | | | | | | |
| | ප්‍රසූත තන්ත්‍ර | සිංහල | | | | | | |
| ද්‍රව්‍යගුණ විඥාන | ද්‍රව්‍යගුණ විඥාන | සිංහල ඉංග්‍රීසි | | 01 | 04 | | ආධුනික 01 | ප්‍රදර්ශක 02 |
| | රස ශාස්ත්‍ර | සිංහල ඉංග්‍රීසි | | | 02 | | | |
| | භෛෂජ්‍ය කල්පනා | සිංහල ඉංග්‍රීසි | | | 02 | | | |
| | ඖෂධ පැල වගාව | සිංහල ඉංග්‍රීසි | | | | | ආධුනික 01 | |
| | විශ්ලේෂක රසායන විද්‍යාව | ඉංග්‍රීසි | | | | | | |
| | ශාඛ රසායනය හා ස්වාභාවික නිෂ්පාදන | ඉංග්‍රීසි | | | | | | |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | හින්දි<br>ඉංග්‍රීසි<br>සංස්කෘත | සිංහල / ඉංග්‍රීසි | | ආචාර්ය 01 | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 03 | | ආධුනික කථිකාචාර්ය 05 | තාවකාලික කථිකාචාර්ය 02<br>ප්‍රදර්ශක 04 |
| | ජ්‍යොතිෂ මූලධර්ම | | | | | | | |
| | භූත විද්‍යාව | | | | | | | |
| | BPHM11011 Histry of Medicine | | | | | | | |
| | Manavasarirara Vijnana (Human Gross Anatomy ) | | | | | | | |
| | Manavasarirara Vijnana (Human Physiology) | | | | | | | |
| | Introduction to Biochemistry | | | | | | | |
| | English for Ayurvedha Medical Education | | | | | | | |
| | Information & Communication Technology 1 | | | | | | | |
| | Advanced English for Scientific Communication1 | | | | | | | |
| | Padarthavijnana | | | | | | | |
| | Human History | | | | | | | |
| | Manavasarirakri-yavijnana (Heuman Physiology) 11 | | | | | | | |
| | Metabolism and Nutrition | | | | | | | |
| | Sanskrit for Ayurveda 1 | | | | | | | |
| | Tamil Language For Ayurveda practice | | | | | | | |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | Hindi Language for Ayurveda pratice | | | | | | | |
| | Embryology and Genetic | | | | | | | |
| | Manavasarirakri-yavijnana (Heuman Physiology) 111 | | | | | | | |
| | Molecular Biology | සිංහල/ ඉංග්‍රීසි | | | | | | |
| | Immunology | | | | | | | |
| | Sanskrit for Ayurveda 11 | | | | | | | |
| | Sanskrit for Advanced Studies in Ayurveda 11 | | | | | | | |
| | Sanskrit for Advanced Studies in Ayurveda 11 | | | | | | | |
| | රෝග විඥාන | - | - | | | | - | - |
| චිකිත්සා | කාය චිකිත්සා | | | | | | | |
| | දේශීය චිකිත්සා | | | | | | | |
| | අගද තන්ත්‍ර | | | | | | | |
| | ස්වස්ථවෘත්ත | | | ආචාර්ය 02 | 06 | | අධුනික 01 | ප්‍රදර්ශක 02 තාවකාලික කථි 02 |
| | ව්‍යාධිවේදය | | | | | | | |
| | ව්‍යවහාරික වෛද්‍ය විද්‍යාව හා ධූලක වේදය | | | | | | | |
| | පර්යේෂණ ක්‍රමවේදය | | | | | | | |
| මුළු ගණන | | | | 05 | 20 | - | 12 | 16 |

8. අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ විස්තර :

| ආයතන අංශය/ අංශය | විධායක කාර්ය මණ්ඩලය | ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික | මාණ්ඩලික | කණිෂ්ඨ | සුළු සේවක |
|---|---|---|---|---|---|
| චිකිත්සා | - | 02 | 02 | - | 02 |
| ශල්‍ය ශාලක්‍ය | - | 01 | 01 | - | 01 |
| ස්ත්‍රීරෝග හා කෞමාරභෘත්‍ය | - | - | 02 | - | 01 |
| ද්‍රව්‍යගුණ විඥාන | - | - | 03 | 01 | 02 |
| මූලධර්ම + වෛද්‍ය විද්‍යා තාක්ෂණ අංශය | *01 | 02 | 02 | 02 | 02 |
| පාලන | 01 | 02 | 11 | 07 | 03 |
| නඩත්තු | - | 01 | 02 | 04 | 07 |
| විභාග | 01 | 05 | 03 | 01 | - |
| ගිණුම් | 02 | 03 | 08 | - | 02 |
| පුස්තකාලය | 02 | 02 | 01 | 03 | 02 |
| පරිගණක | - | - | 01 | - | 01 |
| පශචාද් උපාධි ඒකකය | - | - | 02 | - | - |
| **මුළු ගණන** | **07** | **18** | **38** | **18** | **23** |

* ජ්‍යෙෂ්ඨ කාර්මික නිලධාරී

9. පර්යේෂණ, නව සොයා ගැනීම් සහ ප්‍රකාශන පිළිබඳ විස්තර :

| විෂයය | ප්‍රකාශිත | | මුදල් ඉපයීම් | ඉදිරිපත් කිරීම් |
|---|---|---|---|---|
| අ. පර්යේෂණ ගණන | ශල්‍ය ශාලක්‍ය | 05 | - | 02 |
| | කෞමාරභෘත්‍ය හා ස්ත්‍රීරෝග | 04 | - | - |
| | ද්‍රව්‍යගුණ විඥාන | 06 | | 22 |
| | චිකිත්සා | 08 | | 08 |
| | මූලධර්ම | 11 | | 05 |

| | | | | |
|---|---|---|---|---|
| ආ. නව සොයා ගැනීම් | ද්‍රව්‍යගුණ විඥාන | | | 01 |
| ඇ. සඟරා ගණන | | | | - |
| ඈ. පොත් ගණන | ශල්‍ය ශාලක්‍ය | 01 | | - |
| ඉ. ලිපි ගණන | ශල්‍ය ශාලක්‍ය<br>ද්‍රව්‍යගුණ විඥාන<br>කෞමාරභෘත්‍ය හා ස්ත්‍රීරෝග<br>චිකිත්සා<br>මූලධර්ම | 04<br>04<br>03<br>05<br>01 | | 01<br>03<br>-<br>02<br>01 |
| ඊ. වෙනත් | ද්‍රව්‍යගුණ විඥාන | | | 01 |
| මුළු ගණන | | 52 | | 46 |

10. **වැඩ සටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු පිළිබඳ විස්තර :**

| විෂයය | සහභාගි වූ | සම්පූර්ණ කරන ලද | ඉදිරිපත් කරන ලද |
|---|---|---|---|
| අ. පශ්චාද් උපාධි වැඩසටහන්<br>ශල්‍ය ශාලක්‍ය<br>චිකිත්සා<br>ද්‍රව්‍යගුණ විඥාන | <br>01<br>01<br>03 | <br>-<br>-<br>01 | |
| ආ. පශ්චාද් ඩිප්ලෝමා වැඩසටහන්<br>ද්‍රව්‍යගුණ විඥාන | <br>02 | <br>- | |
| ඇ. උපාධි වැඩසටහන් | | | |
| ඈ. ඩිප්ලෝමා වැඩසටහන් | | | |
| ඉ. සහතික පත්‍ර පාඨමාලා වැඩසටහන්<br>කෞමාරභෘත්‍ය හා ස්ත්‍රීරෝග<br>ද්‍රව්‍යගුණ විඥාන | <br>-<br>07 | <br>01<br>04 | <br>03<br>- |
| ඊ. වෙනත්<br>කෞමාරභෘත්‍ය හා ස්ත්‍රීරෝග<br>ද්‍රව්‍යගුණ විඥාන<br>මූලධර්ම<br>ශල්‍ය ශාලක්‍ය | <br>04<br>13<br>06<br>02 | <br>-<br>01<br>- | <br>05<br>01<br>- |
| **මුළු ගණන** | **39** | **07** | **09** |

11. සම්මාන ලැබීම් පිළිබඳ විස්තර :

| | විෂයය | සම්මාන ගණන | අධ්‍යයන කාර්ය මණ්ඩලය | සිසුන් ගණන |
|---|---|---|---|---|
| අ. දේශීය සම්මාන | - | - | - | - |
| ආ. ජාතික සම්මාන | - | - | - | - |
| ඇ. ජාත්‍යන්තර සම්මාන | - | - | - | - |
| ඈ. වෙනත් | - | - | - | - |
| මුළු ගණන | - | - | - | - |

12. ආරම්භ කරන ලද නව පාඨමාලාවල විස්තර :

| අධ්‍යයනාංශය | පාඨමාලාව | මාධ්‍යය | සහතික පත්‍ර | ඩිප්ලෝමා | පශ්චාද් ඩිප්ලෝමා | පශ්චාද් උපාධි | දර්ශනපති | දර්ශනශූරී |
|---|---|---|---|---|---|---|---|---|
| කෞමාරභෘත්‍ය හා ස්ත්‍රීරෝග | ආයුර්වේද රූපලාවන්‍ය සහතික පත්‍ර | සිංහල | 01 | | | | | |
| | ස්කෑනින් සහතික පත්‍ර පාඨමාලාව | සිංහල | 01 | | | | | |
| මුළු ගණන | | | **02** | | | | | |

13. පුනරාවර්තන වියදම් විස්තර :

| විෂයය | 2012 | 2013 |
|---|---|---|
| අ. පුද්ගල පඩිනඩි | 103,904,513 | 116,786,193 |
| ආ. ගමන් වියදම් | 191,069 | 513,557 |
| ඇ. සැපයුම් | 6,738,429 | 6,348,978 |
| ඈ. නඩත්තු | 2,957,210 | 2,704,778 |
| ඉ. ගිණුම්ගත සේවා | 21,714,708 | 23,559,257 |
| ඊ. වෙනත් | 4,570,415 | 8,235,985 |
| මුළු ගණන | **140,076,344** | **158,148,748** |

14. ප්‍රාග්ධන වියදම් විස්තර :

| විෂයය | 2012 | 2013 |
|---|---|---|
| ප්‍රාග්ධන වත්කම් වැඩි දියුණු කිරීම | 5,020,467 | 13,586,481 |
| වත්කම් මිල දී ගැනීම් | 9,147,244 | 15,799,948 |
| ඉදිකිරීම් | 32,758,339 | 2,766,108 |
| වෙනත් | 3,272,038 | - |
| මුළු ගණන | **50,198,088** | **32,152,537** |

15. ව්‍යාපෘති පිළිබඳ විස්තර (දේශීය/විදේශීය මූල්‍ය දායකත්වය) :

| නම සහ විස්තර | ණය/ආධාර | ආධාර දෙන ආයතනය | මුළු පිරිවැය | අරමුදල් ලැබීම් | වෙනස |
|---|---|---|---|---|---|
| වෛද්‍ය ඩබ්.ඒ.එල්. චන්ද්‍රසිරි මයා<br>2006<br>2008<br>2009 | <br>687,150,.00<br>687,150,.00<br>687,150,.00 | N.C.A.S | <br>687,150.00<br>687,150,00<br>528,351.28 | <br>687,150.00<br>687,150.00<br>687,150.00 | <br><br><br>158,789.72 |
| වෛද්‍ය එස්.එම්.එස්. සමරකෝන් මයා | 287,470.79 | N.C.A.S | 287,470.79 | 287,470.79 | |
| වෛද්‍ය තිස්ස හේවාවිතාන මයා<br>2008<br>2010<br>2011 | <br>250,000,00<br>250,000,00<br>124,800.00 | U.G.C .R.F | <br>250,000.00<br>250,000.00<br>105,143.32 | <br>250,000.00<br>250,000.00<br>124,800.00 | <br><br><br>19,656,.68 |
| වෛද්‍ය එච්.එස්. සකුන්තලා මිය | 250,000,00 | | 225,295.04 | 250,000.00 | 24,704.96 |

| | | | | | |
|---|---|---|---|---|---|
| වෛද්‍ය රූපා මදනායක මෙවි 2009 | 250,000,00 | U.G.C .R.F | 221,918.91 | 250,000.00 | 28,081.09 |
| වෛද්‍ය ඒ.ඒ.ජේ. පුෂ්පකුමාර මයා 2010 | 500,000,00 | U.G.C .R.F | 309,176.62 | 500,000.00 | 190,823.38 |
| වෛද්‍ය ජේ.එම්.පී.ආර්.කේ. ජයසිංහ මිය 2010 | 500,000,00 | U.G.C .R.F | 139,577.58 | 250,000.00 | 19,822.42 |
| වෛද්‍ය ජේ.ඒ.ඩී.පී.පී. ජයකොඩි මෙවි 2010 | 500,000.00 | U.G.C .R.F | 500,557.14 | 500,000.00 | 557.14 |
| වෛද්‍ය එච්.පී. වක්කුඹුර මිය 2010<br>2013 | 250,000,00<br>250,000,00 | U.G.C .R.F | 250,000.00<br>193.15 | 250,000.00<br>250,000.00 | -<br>249,806.85 |
| වෛද්‍ය ඩබ්.පී.බී.එච්.එස්.කරුණාරත්න මිය 2013 | 500,000,00 | U.G.C .R.F | 500,000.00 | 500,000.00 | - |
| මුළු ගණන | 5,973,720.79 | | 4,941,983.83 | 5,723,720.79 | 692,242.24 |

16. ව්‍යාපෘති වියදම් පිළිබඳ විස්තර : (දේශීය විදේශීය මූල්‍ය දායකත්වය)

| නම | මුළු පිරිවැය | වියදම් 2012 | වියදම් 2013 | සමුච්චිත වියදම් 2013.12.31 දිනට | ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|
| වෛද්‍ය ඩබ්.ඒ.එල්. චන්ද්‍රසිරි මයා | 2,061,450.00 | 1,902,651.28 | - | 1,902,651.28 | 92 |
| වෛද්‍ය එස්.එම්.එස්. සමරකෝන් මයා | 287,470.79 | 219,747.79 | 67,723.00 | 287,470.79 | 100 |
| වෛද්‍ය තිස්ස හේවාවිතාන මයා | 624,800.00 | 537,661.32 | 67,482.00 | 605,143.32 | 97 |
| වෛද්‍ය එච්.එස්. සකුන්තලා මිය | 250,000.00 | 225,295.04 | - | 225,295.04 | 90 |
| වෛද්‍ය රූපා මදනායක මෙවි | 250,000.00 | 207,295.04 | 18,000.00 | 225,295.04 | 90 |
| වෛද්‍ය ඒ.ඒ.ජේ. පුෂ්පකුමාර මයා | 500,000.00 | 268,392.62 | 40,784.00 | 309,176.62 | 62 |
| වෛද්‍ය ජේ.එම්.පී.ආර්.කේ. ජයසිංහ මිය | 250,000.00 | 212,177.58 | 18,000.00 | 230,177.58 | 92 |
| වෛද්‍ය ජේ.ඒ.ඩී.පී.පී. ජයකොඩි මෙවි | 500,000.00 | 500,000.00 | - | 500,000.00 | 100 |
| වෛද්‍ය එච්.පී. වක්කුඹුර මිය | 500,000.00 | 250,193.15 | - | 250,193.15 | 50 |
| වෛද්‍ය ඩබ්.පී.බී.එච්.එස්.කරුණාරත්න මිය | 500,000.00 | - | 500,000.00 | 500,000.00 | 100 |
| මුළු ගණන | 5,723,720.79 | 4,323,413.82 | 711,989.00 | 5,035,402.82 | 773 |

17. මූල්‍ය තත්ත්වයේ ප්‍රගතිය පිළිබඳ විස්තර (වියදම්) :

| විෂයය | 2013 ප්‍රතිපාදන | 2013 වියදම් | ඉතිරි/ඉක්මයාම (සීමාව ඉක්මවීම) |
|---|---|---|---|
| රජයේ පුනරුත්ථාපන ආධාර | 137,100,000 | 158,148,748 | |
| රජයේ ප්‍රාග්ධන ආධාර | 50,650,000 | 32,152,537 | |
| මුළු ගණන | 187,750,000 | 190,301,285 | |

18. මූල්‍ය තත්ත්වයේ ප්‍රගතිය පිළිබඳ විස්තර (අභ්‍යන්තර ආදායම) :

| ආදායම් ප්‍රභවය | ප්‍රතිපාදන/වෙන්කිරීම් ඇස්තමේන්තු | ලැබීම් 2013 | අඩු/වැඩි |
|---|---|---|---|
| අ. උපාධි අපේක්ෂක | 297,375,000 | 9,406,970 | - |
| ආ. පශ්චාද් උපාධි | | - | - |
| ඇ. උපදේශක | | - | - |
| ඈ. වෙනත් - පාඨමාලා මුදල් | | 15,266,960 | - |
| මුළු ගණන | 297,375,000 | 24,673,930 | - |

19. මූල්‍ය ක්‍රියාකාරිත්ව විශ්ලේෂණය - 2013 :

| විෂයය | සංකේතය | ඒක ශිෂ්‍ය පිරිවැය |
|---|---|---|
| අ. ඒක ශිෂ්‍ය පිරිවැය පුනරාවර්තන වියදම් (පු.වි) පු.වි/ශිෂ්‍ය සංඛ්‍යාව | - | 3888,571 |
| ආ. ඒක ශිෂ්‍ය පිරිවැය ප්‍රාග්ධන වියදම් (පු.වි) පු.වි/ශිෂ්‍ය සංඛ්‍යාව | - | **78998** |
| මුළු ගණන | - | **467569** |

20. යටිතල පහසුකම් සඳහා 2013 වර්ෂය තුළ ලැබීම් :

| යටිතල පහසුකම් පිළිබඳ විස්තර | වියදම් | ප්‍රගතිය |
|---|---|---|
| 1. වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම් | 13,586,480 | 100% |
| 2. ඉදිකිරීම් | 2,766,108 | 25% |
| මුළු ගණන | 16352588 | |

21. වෙනත් විස්තර (වාර්තාවට අදාළ) :

21.1 පුස්තකාලය

2013 වර්ෂයේ පොත් ප්‍රතිග්‍රහණය කර ගැනීමේ සාරාංශය

| විස්තරය | මිල දී ගැනීම | පරිත්‍යාග | එකතුව |
|---|---|---|---|
| පොත් | 379 | | 379 |
| වාර සඟරා | 07 | - | 07 |

21.2 පරිගණක අංශය

විද්‍යායතනය සතු කුඩා පරිගණක ඒකකයේ සිසුන් වෙනුවෙන් වූ පහසුකම් අඩු මට්ටමක පැවැති බැවින් සියලු පහසුකම්වලින් සමන්විත පරිගණක 100 කින් යුතු නව පරිගණක මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම හා අන්තර්ජාල පහසුකම් ආයතනයේ සෑම ස්ථානයකටම ලබාදීමේ අරමුණින් අන්තර්ජාල ජාලගත කිරීමේ කටයුතු ආරම්භ කර ඇත.

21.3 යටිතල පහසුකම් සංවර්ධනය

භෛෂජ්‍ය ගොඩනැගිල්ල, පරිපාලන ගොඩනැගිල්ල සහ අධ්‍යයනාංශ ගොඩනැගිලි ඉදි කිරීමට අදාළ උපදේශක සේවා ආරම්භ කර ඇත.

ඒ 14 ගොඩනැගිල්ල විද්‍යාගාර සංකීර්ණයක් බවට පත් කරීම.

කුඩා පරිමාණයේ ශ්‍රවණාගාරයක් ඉදිකිරීම.

අභ්‍යන්තර මාර්ග පද්ධතිය කාපට් අතුරා නවීකරණය කිරීම. හා දේශනශාලා නවීකරණය කිරීම.

## අධ්‍යක්ෂ වාර්තාව

1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ දැක්වෙන විධිවිධාන යටතේ කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධ ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ 2013 වර්ෂයට අදාල මූල්‍ය කටයුතු පිළිබඳ වාර්තාව.

2013 වර්ෂය සඳහා ආයතනයට මහා භාණ්ඩාගාරය විසින් නිදහස් කර ඇති ආධාර මුදල් පහත පරිදි වේ.

**පුනරාවර්තන ආධාර**

| | | (රු. මිලියන) |
|---|---|---|
| රජයේ ඇස්තමේන්තු මගින් ලද ආධාර | - | 137.10 |
| අනෙකුත් පුනරාවර්තන ආදායම | - | 24.67 |
| | - | 161.77 |

**එකතු කළා**

| | | | |
|---|---|---|---|
| ක්‍රමක්ෂය | ප්‍රාග්ධන | - | 25.83 |
| මුළු එකතුව (පුනරාවර්තන) | | - | 187.60 |
| **මූලධන ආධාර** | | - | 50.65 |

| | | | | | |
|---|---|---|---|---|---|
| වැය ශීර්ෂ | 101 | - | පුරුත්ථාපන සහ නඩත්තු කටයුතු | - | 13.58 |
| වැය ශීර්ෂය | 102 | -<br>- | භාණ්ඩ, උපකරණ, පුස්තකාල<br>පොත් හා වාර සඟරා අත්පත් කර ගැනීම | - | 15.79 |
| වැය ශීර්ෂය | 103 | - | ගොඩනැගිලි ඉදි කිරීම් | - | 2.76 |
| | | | දැනුම වර්ධනය හා ආයතනික ප්‍රවර්ධන කටයුතු | - | - |
| මුළු එකතුව (ප්‍රාග්ධන) | | | | | 32.15 |

**ආදායම**

2013 ගිණුම් වර්ෂය තුළ පුනරාවර්තන ආධාර ලෙස රජයෙන් ලැබුණු මුදල රු. 137,100,000 කි.

විද්‍යායතනය මගින් වර්ෂය තුළ දී අනිකුත් පුනරාවර්තන ආදායම් මාර්ග වලින් ලබා ගත් මුදල රු. 24,673,930 කි. ඒ අනුව මුළු ආදායම රු.187,606,357 කි.

**වියදම**

2013 වර්ෂය සඳහා මුළු පුනරාවර්තන වියදම රු.196,076,530 ක් විය. මේ අනුව වර්ෂයේ ආදායමට වඩා වැඩියෙන් දරා ඇති වියදම රු.8,470,174 කි.

<u>ස්ථාවර වත්කම් ක්ෂය කිරීම</u>

ආයතනයේ ස්ථාවර වත්කම් ක්ෂය කිරීම වෙනුවෙන් 2013 වර්ෂය තුළ රු. 25,832,426 වෙන් කර ඇත.

<u>ප්‍රාග්ධන සේවා මූලධන ප්‍රතිඵලය</u>

<u>වැය ශිර්ෂ 101 - පුනරුත්ථාපන සහ නඩත්තු කටයුතු</u>

පුනරුත්ථාපන සහ නඩත්තු වැය ශීර්ෂ (101) ලැබුණු ප්‍රතිපාදිත මුදල රු. 14,000,000 ක් වන අතර, එමගින් 2013 වර්ෂය දරා ඇති මුළු වියදම රු. 13,586,480 කි.

<u>වැය ශිර්ෂ අංක 102 - භාණ්ඩ අත්පත් කර ගැනීම</u>

වත්කම් අත්පත් කර ගැනීමේ වැය ශීර්ෂ (102) සඳහා ලැබුණු ප්‍රතිපදාන මුදල රු.23,850,000 ක් වන අතර, ඒ සඳහා දරණ ලද මුළු වියදම ගැලපීම් සහිතව රු. 15,799,947 කි.

<u>වැය ශිර්ෂ අංක 103 - ඉදි කිරීම් කටයුතු</u>

ඉදි කිරීම් වැය ශීර්ෂය (103) සඳහා ලැබුණු ප්‍රතිපාදන මුදල රු. 12,800,000/- ක් වන අතර, එහි ගැලපීම් සමඟ දරණ ලද මුළු වියදම රු. 2,766,108 කි.

මහාචාර්ය ජනිතා ඒ. ලියනගේ
අධ්‍යක්ෂ

2013.12.31 දිනට මූල්‍ය තත්වය දැක්වෙන ප්‍රකාශනය

| | 2013 | | 2012 | |
|---|---|---|---|---|
| | Rs. | Rs. | Rs. | Rs. |
| වත්කම් | | | | |
| ජංගම නොවන වත්කම් | | | | |
| (අ) ඉඩම් | 72,126,250 | | 72,126,250 | |
| (ආ) ගොඩනැගිලි | 167,494,630 | | 163,083,528 | |
| (ඇ) කාර්යාල උපකරණ | 8,432,755 | | 4,642,250 | |
| (ඈ) රසායනාගාර හා අධ්‍යා උපකරණ | 21,243,726 | | 23,858,556 | |
| (ඉ) ලී බඩු හා සවි කිරීම් | 18,565,336 | | 16,170,147 | |
| (ඊ) පුස්තකාල පොත් සහ සඟරා | 5,324,552 | | 6,177,639 | |
| (උ) මෝටර් රථ වාහන | 4,490,319 | | 7,031,497 | |
| (ඌ) යන්ත්‍රෝපකරණ | 2,931,793 | 300,609,361 | 3,695,535 | 296,785,401 |
| (එ) වෙනත් | | 1,109,358 | | 1,361,857 |
| (ඒ) නිම නොවූ වැඩ | | 69,205,669 | | 66,439,561 |
| (ඔ) මූලධන අත්තිකාරම් | | 5,900,954 | | 6,003,579 |
| ආයෝජන | | - | | |
| ස්ථාවර තැන්පත් | | 60,030,163 | | 49,554,753 |
| | | **436,855,505** | | **420,145,150** |
| ජංගම වත්කම් | | | | |
| (අ) ගබඩා අත්තිකාරම් | 2,171,487 | | 2,141,600 | |
| (ආ) ණය ගැතියෝ | 1,517,040 | | 1,899,540 | |
| (ඇ) ණය සහ අත්තිකාරම් | 19,019,779 | | 20,060,331 | |
| (ඈ) මිශ්‍ර අත්තිකාරම් | 15,000 | | 6,000 | |
| (ඉ) පර්යේෂණ අත්තිකාරම් | - | | - | |
| (ඊ) පෙර ගෙවීම | 232,997 | | 10,287 | |
| (උ) බැංකු ශේෂය | 31,583,503 | | 19,564,634 | |
| (ඌ) බැංකු ශේෂය ( බාහිර පාඨමාලා) | 4,346,319 | | 5,860,067 | |
| (එ) සුළු මුදල් ශේෂය | 180 | | 180 | |
| (ඒ) වෙනත් වත්කම් | 3,771,762 | 62,658,067 | 4,451,894 | 53,994,532 |
| මුළු වත්කම් | | 499,513,572 | | **474,139,682** |
| වගකීම් | | | | |
| (අ) ජංගම වගකීම් | 446,200 | | 440,310 | |
| (ආ) ගෙවීම් | 19,837,525 | | 20,370,454 | |
| (ඇ) උපචිත වියදම් | 3,111,222 | 23,394,947 | 1,596,156 | 22,406,920 |
| ජංගම නොවන වගකීම් | | | | |
| (අ) පාරිතෝෂික දීමනා වෙන් කිරීම් | | 41,663,178 | | 37,599,840 |
| මුළු වගකීම් | | 65,058,125 | | 60,006,759 |
| මුළු ශුද්ධ වත්කම්/හිමිකම් | | 434,455,447 | | 414,132,923 |
| ශුද්ධ වත්කම්/හිමිකම් | | | | |
| (අ) වැය කළ ප්‍රාග්ධනය | 248,597,876 | | 242,277,765 | |
| (ආ) වැය නොකළ ප්‍රාග්ධනය | 36,483,619 | | 18,359,914 | |
| (ඇ) අරමුදල | (27,175,555) | | (17,698,629) | |
| (ඈ) විශේෂ කටයුතු සඳහා වූ ප්‍රදාන | 176,549,506 | | 171,193,873 | |
| මුළු ශුද්ධ වත්කම්/හිමිකම් | | 434,455,447 | | 414,132,923 |

මහාචාර්ය ජනිතා ඒ. ලියනගේ
අධ්‍යක්ෂ

ඩබ්.ඒ.පී.එස්. මොලගොඩ
නියෝජ්‍ය මූල්‍යාධිකාරී

## 2013.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ
## ආදායම් සහ වියදම් පිළිබඳ ප්‍රකාශනය

| | 2013<br>රු. | රු. | 2012<br>රු. | රු. |
|---|---|---|---|---|
| මෙහෙයුම් ආදායම් | | | | |
| පුනරාවර්තන ආධාර | | 137,100,000 | | 127,600,000 |
| ක්‍රමක්ෂය | | 25,832,426 | | 19,747,628 |
| වෙනත් ආදායම් | | | | |
| (1) ණය සහ අත්තිකාරම් පොලී | 807,189 | | 759,447 | |
| (2) විවිධ ලැබීම් | 404,651 | | 2,530,119 | |
| (3) පොලී ආදායම | 6,986,849 | | 880,624 | |
| (4) ශිෂ්‍ය ලියාපදිංචි ගාස්තු | 287,115 | | 111,875 | |
| (5) විභාග ගාස්තු | 23,350 | | 4,050 | |
| (6) පුස්තකාල දඩ මුදල් | 38,352 | | 69,904 | |
| (7) වෛද්‍ය ගාස්තු | 12,870 | | 18,060 | |
| (8) දේපල වලින් වූ කුලී ආදායම් | 351,974 | | 318,855 | |
| (9) ප්‍රකාශන විකුණුම් | - | | - | |
| (10) පැරණි භාණ්ඩ විකුණුම් (රථ වාහන) | 432,074 | | - | |
| (11) සම්බන්ධීකාරක ක්‍රියාකාරකම් | 62,547 | | - | |
| (12) බාහිර පාඨමාලා ආදායම් | 15,266,960 | | 4,855,636 | |
| | | 24,673,931 | | 15,780,657 |
| | | **187,606,357** | | **163,128,285** |
| මෙහෙයුම් වියදම් | | | | |
| පුද්ගල පඩිනඩි | 116,786,193 | | 95,133,199 | |
| ගමන් වියදම් | 513,557 | | 189,848 | |
| සැපයීම | 6,348,978 | | 5,527,468 | |
| නඩත්තු | 2,704,778 | | 2,957,349 | |
| ගිවිසුම් ගත සේවා | 23,559,257 | | 16,590,316 | |
| පර්යේෂණ සහ සංවර්ධන | 147,735 | | 263,132 | |
| ක්ෂය වීම් | 25,832,426 | | 15,132,899 | |
| වෙනත් මෙහෙයුම් වියදම් | 8,088,250 | | 4,665,628 | |
| පාඨමාලා වියදම් | 12,095,356 | | 4,855,636 | |
| මුළු මෙහෙයුම් වියදම් | | **196,076,530** | | **168,611,950** |
| මෙහෙයුම් කටයුතු වලින් ජනිත වූ අතිරික්තය (ඌනතාවය) | | **(8,470,173)** | | **(5,483,665)** |

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } ඊසී/එෆ්/ජීඩබ්ඒඅයි/1 /13/10 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2014 සැප්තැම්බර් 24 දින

අධ්‍යක්ෂ,

ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය.

**කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 (1) උපවගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වගන්තිය ප්‍රකාරව පනවා ඇති 1995 අංක 1 දරන ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතන නියමාවලියේ 19 වගන්තිය, විශ්වවිද්‍යාල පනතේ 107 (5) උප වගන්තිය සමග සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. විශ්වවිද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාරව විද්‍යායතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. විශ්වවිද්‍යාල පනතේ 108 (2) උපවගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් විද්‍යායතනයේ අධ්‍යක්ෂවරයා වෙත 2014 මැයි 19 දින නිකුත්කරන ලදි.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම.**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විද්‍යායතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විද්‍යායතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුලත්වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1. තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

සේවක පාරිතෝෂික ප්‍රතිපාදන සඳහා අරමුදලක් ඇති කිරීම සහ ආයෝජනය කිරීම සම්බන්ධ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශන වල සටහන් මගින් හෙළිදරව් කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ). විද්‍යායතනයට අයත් පර්චස් 243.9 ක ඉඩම් හා මෝටර් රථයක් තක්සේරු කර ගිණුම් ගත කර නොතිබුණි.

(ආ) රු. 141,060,834 ක් වූ ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණන සංචිතය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සංචිත ලෙස දැක්විය යුතු වුවත්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ විශේෂිත අරමුදල් (Restricted Fund) යටතේ දක්වා තිබුණි.

#### 2.2.3 නොසැසඳූ පාලන ගිණුම්

ස්ථාවර වත්කම් සඳහා මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කරන ලද උපලේඛනය හා ස්ථාවර වත්කම් ලේඛනය සමග සැසඳීමේ දී රු. 6,296,490 ක වෙනසක් අනාවරණය වූ අතර රු.13, 586,481 ක් වටිනා ගොඩනැගිලි සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි.

2.2.4 ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ). ගෙවිය යුතු ඇප තැන්පත්

මුලාා ප්‍රකාශනවල ගෙවිය යුතු ඇප තැන්පත් ලෙස දක්වා තිබූ වර්ෂ 03 සිට 05 දක්වා කාලයක සිට පැවත එන එකතුව රු. 165,569 ක් වූ රඳවා ගැනීම්, මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව නිරවුල් කිරීමට විගණිත දිනය වූ 2014 ජුනි 02 දක්වාම කටයුතු කර නොතිබුණි.

(ආ). අයවිය යුතු නේවාසිකාගාර ගාස්තු

2013 දෙසැම්බර් 31 දිනට ශිෂ්‍ය අධ්‍යයන කාල සීමාව තුළ අයකර නොගත් එකතුව රු.254,865 ක් වූ හිඟ නේවාසිකාගාර ගාස්තු 2014 මැයි 30 දින වන විටත් අයකරගෙන නොතිබුණි.

2.2.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම.

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ). ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ VIII පරිච්ඡේදයේ 10:1 වගන්තිය, 1997 පෙබරවාරි 03 දිනැති අංක 07/97 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | මාසයකට දින කිහිපයක් සඳහා සහ පැය 04 ට වැඩි රාජකාරී කටයුතු කළ පැය ගණන දිනක වැටුපට අනුපාතික කර නිවාඩු දින වැටුප් ලබාගෙන තිබුණු අතර 1997 අප්‍රේල් 01 දිනැති අංක 707 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ යෙහි සඳහන් කරුණු වලටද පටහැනිව ගෙවීම් කිරීම නිසා රු. 19,048 ක් වැඩිපුර ගෙවා තිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා ආයතන සංග්‍රහයෙහි XX වන පරිච්ඡේදයේ 3(1)වගන්තිය සහ X පරිච්ඡේදයේ 1.6.1 වගන්තිය | අධ්‍යයන කාර්යය මණ්ඩලයේ පැමිණීම හා පිටවීම සහ නිවාඩු සනාථ කර ගැනීම සඳහා අදාල පොත්පත් ලේඛන පවත්වා නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා ගෙවූ වැටුප් හා දීමනා රු. 42,224,404 ක් සම්බන්ධයෙන් ශිෂ්‍ය පැමිණීමේ වාර්තා හෝ විගණනයට ඉදිරිපත් නොවීය. |
| (ඇ) | 1994 ජූනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | භාණ්ඩාගාර ලේකම්ගේ සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතියෙන් තොරව විද්‍යායතනයේ කළමනාකරණ මණ්ඩලය අනුමත කර ඇති නිර්ණායක මත ගාස්තු අයකරන පාඨමාලාවන් සඳහා සාමාන්‍ය රාජකාරි වේලාවන් තුලදී මෙන්ම සති අන්ත රාජකාරි සඳහා විවිධ දීමනාවන් හා ගාස්තු ලෙස රු.10,315,605 ක් ගෙවා තිබුණි. |
| (ඈ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය. | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු. 8,470,174 ක් වූ අතර ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.5,483,665 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.2,986,509 කින් වැඩි වීමට පෞද්ගලික පඩිනඩි රු. 12,881,680 කින් හා ගිවිසුම්ගත සේවා සහ වෙනත් මෙහෙයුම් වියදම් රු.5,813,230 කින් වැඩි වීම විශේෂයෙන් බලපා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 අධ්‍යයන කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ). අධ්‍යයන කාර්යසාධනය සම්බන්ධයෙන් විගණනයට නිවැරදි තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි.

(ආ). ඒක ශිෂ්‍ය පිරිවැය

විද්‍යායතනයේ සමාලෝචිත වර්ෂයේ ඒක ශිෂ්‍ය පිරිවැය රු.388,771 ක් වූ අතර ඉකුත් වර්ෂයේ එම පිරිවැය රු. 384,825 ක් වී තිබුණි.

### 4.2 කළමණාකරන අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගාස්තු අයකර පවත්වනු ලබන පාඨමාලා නිර්ණායකය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. කැලණිය විශ්වවිද්‍යාලයේ නිර්ණායකය පදනම් කරගෙන මෙම විද්‍යායතනයේ ගාස්තු අයකර පවත්වනු ලබන පාඨමාලා සඳහා නිර්ණායක පිළියෙල කර තිබූ අතර කැලණිය විශ්වවිද්‍යාලයේ නිර්ණායක අභිබවා පාඨමාලා සංවිධානය කිරීම වෙනුවෙන් දීමනා ගෙවා තිබුණි.

රජයේ නිවාඩු දින හෝ සති අන්ත නිවාඩු දින කරනු ලබන සේවා වෙනුවෙන් අධ්‍යයන කාර්ය මණ්ඩලයට ගෙවීම් සම්බන්ධයෙන් කැලණිය විශ්වවිද්‍යාලයේ නිර්ණායකයට හා විද්‍යායතනයේ නිර්ණායකයට අනුව වැඩකරන දිනකට රු.5,000 බැගින් ගෙවිය හැකි වුවත් දිනකදී පවත්වන්නා වූ එක් පාඨමාලාවකට රු. 5,000 බැගින් ගෙවීමෙන් රු.562,500 ක් වැඩිපුර ගෙවා තිබුණි. කළමනාකරණ මණ්ඩලය දීර්ඝ වශයෙන් සලකා බලා මෙම දීමනාව ගෙවනු ලබන බව අධ්‍යක්ෂවරිය විසින් ප්‍රකාශ කරන ලදි.

(ආ). 2013 දෙසැම්බර් 31 දිනට කෙරීගෙන යන වැඩ වටිනාකම ලෙස රු. 69,205,669 ක් මූල්‍ය ප්‍රකාශනයේ දක්වා තිබුණද එකිනෙක කොන්ත්‍රාත් වල කෙරීගෙන යන වැඩ වටිනාකම එහි ආරම්භක ශේෂය හා ප්‍රාග්ධන ගත කිරීම් පැහැදිලිව හඳුනාගත හැකි පරිදි ලේඛන පිළියෙල කර නොතිබුණි.

## 4.3. ඌණ උපයෝජිත අරමුදල්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ). මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා උසස් අධ්‍යයනය පිළිබඳ ජාතික මධ්‍යස්ථානයේ (NCAS) පර්යේෂණ අරමුදල

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා උසස් අධ්‍යයනය පිළිබඳ ජාතික මධ්‍යස්ථානය විසින් වසර 3 ක පර්යේෂණ පශ්චාත් උපාධියක් හැදෑරීම සඳහා රු. 2,061,450 ක මුදලක් 2006 වසරේ සිට වාරික 03 කින් විද්‍යායතනය වෙත ලබාදී තිබූ අතර 2010 ඔක්තෝබර් 05 දින දක්වා වියදම් වලින් පසු ඉතිරි වූ රු. 158,798 ක් 2014 මැයි 13 දින වන විට ද උපයෝජනය නොකර නිශ්ක්‍රියව පැවති අතර පශ්චාත් උපාධි නිබන්ධනය ද භාර දී නොතිබුණි.

(ආ). පශ්චාත් උපාධි පර්යේෂණ

තුන් අවුරුදු පශ්චාත් උපාධි පාඨමාලාවේ පර්යේෂණ කටයුතු කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ආචාර්යවරු දෙදෙනෙකුට රු. 500,000 ක පර්යේෂණ ආධාර මුදල් ලබා දී තිබූ අතර එයින් රු. 447,214ක් ආචාර්යවරුන් විසින් උපයෝජනය කර තිබුණි. එහෙත් පර්යේෂණවල ප්‍රගති වාර්තා ලබා නොදීම හේතුවෙන් ඉතිරි පර්යේෂණ ආධාර මුදල් රු. 52,786 ක් උපයෝජනය නොකර විශේෂිත අරමුදල් යටතේ නිශ්ක්‍රියව පැවතුණි.

## 4.4 සේවක මණ්ඩල

විද්‍යායතනයේ 2013 දෙසැම්බර් 31 දිනට, අනුමත අධ්‍යයන කාර්ය මණ්ඩලය 48 න් 07 ක් පුරප්පාඩු වී පැවති අතර , අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ අනුමත සංඛ්‍යාව වූ 118 න් 13 ක් පුරප්පාඩු වී තිබුණි.

## 5. ගිණුම්කටයුතුභාවය හා යහ පාලනය

### 5.1 ක්‍රියාකාරී සැලැස්ම

විද්‍යායතනයේ 2013 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව ඉටුකර ගැනීමට අපේක්ෂිත ප්‍රධාන ක්‍රියාකාරකම් 87 ක් අංශ 15 ක් යටතේ දක්වා තිබූ අතර එහි ප්‍රගතිය පරීක්ෂා කිරීමේ දී පහත කරුණු අනාවරණය විය.

(අ). ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීමේදී එකම ක්‍රියාකාරකම අංශ කිහිපයක් යටතේ දක්වා තිබූ අතර, ඊට අදාල අනු ක්‍රියාකාරකම් එම අංශ අතර වෙනස් වීමකින් තොරව දක්වා තිබුණි.

(ආ). ක්‍රියාකාරී සැලැස්මෙහි මෙන්ම ප්‍රගති වාර්තාවෙහි ද මූල්‍යනය හා මූල්‍ය ප්‍රගතිය පිළිබඳ තොරතුරු ඇතුලත් කර නොතිබුණි.

(ඇ). වර්ෂය තුල ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත මුළු ක්‍රියාකාරකම් වලින් වර්ෂය අවසන් වන විටත් ආරම්භ නොකල ව්‍යාපෘති 20 ක් වූ අතර ක්‍රියාකාරී සැලැස්මට අනුව 2013 වර්ෂය අවසන් වන විට නිම කල යුතුව තිබූ එහෙත් නිම කිරීමට අපොහොසත්ව ප්‍රමාද වී ඇති ක්‍රියාකාරකම් 57 ක් විය.

(ඈ). ක්‍රියාකාරී සැලැස්මෙහි වූ අපේක්ෂිත ක්‍රියාකාරකම් 87 න් වර්ෂය තුල සම්පූර්ණයෙන් නිම කල ක්‍රියාකාරකම් 10 ක් පමණක් විය. ඒ අනුව අපේක්ෂිත ක්‍රියාකාරකම් ප්‍රමාණයෙන් වර්ෂය තුල නිම කර ගැනීමට විද්‍යායතනයට හැකිව තිබුණේ සියයට 11 ක් පමණි.

### 5.2 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂයේ අයවැයගත වියදම් හා තථ්‍ය වියදම් සැසඳීමේදි සියයට 10 සිට සියයට 262 දක්වා පරාසයක ප්‍රමාණාත්මක විචලනයන් පැවති අතර අයවැය ලේඛනය මූල්‍ය කලමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගි කරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 5.3 නොවිසඳී ඇති විගණන ඡේද පිළිබඳ නිරීක්ෂණ

2008 වර්ෂයේදී ආයුර්වේද ශික්ෂණ රෝහල ආයුර්වේද දෙපාර්තමේන්තුවට පවරා තිබූ අතර, විද්‍යායතනය විසින් එම රෝහල වෙනුවෙන් ගෙවීම් කර තිබූ රු. 1,940,161 ක මුදල සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ප්‍රතිපූර්ණය කර ගෙන නොතිබුණි. එම මුදල ලැබිය යුතු ජල ගාස්තු ලෙස ජංගම වත්කම් යටතේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. පසුගිය විගණන වාර්තා වලින් හා පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී ද මේ පිළිබඳව අවධානය යොමු කර තිබුණද 2014 මාර්තු 24 දින තෙක් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට වරින් වර යොමුකරවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කල යුතු වේ.

(අ). ගිණුම්කරණය

(ආ).ස්ථාවර වත්කම් පාලනය

(ඇ). පුස්තකාල පාලනය

(ඈ). වාහන පාලනය

(ඉ). කොන්ත්‍රාත් පාලනය

එච්.ඒ.එස්. සමරවීර

විගණකාධිපති .

ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය
කැළණිය විශ්වවිද්‍යාලය, යක්කල.
GAMPAHA WICKRAMARACHCHI AYURVEDA INSTITUTE
UNIVERSITY OF KELANIYA, YAKKALA.

| | | | | | |
|---|---|---|---|---|---|
| අධ්‍යක්ෂ Director | 033-2222739 | නියෝජ්‍ය ලේඛකාධිකාරී (පාලන) Deputy Registrar (Admin) ෆැක්ස්/Fax | 033-2226618 033-2226618 | නියෝජ්‍ය මූලාධිකාරී Deputy Bursar ෆැක්ස්/Fax | 033-2223785 033-2223785 |
| ෆැක්ස් Fax | 033-2222739 | ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී (විභාග) Senior Assistant Registrar (Exams) ෆැක්ස්/Fax | 033-2223784 033-2223784 | සහකාර මූලාධිකාරී (සැපයුම්) Assistant Bursar (Supplies) | 033-3340105 |
| කාර්යාලය General Office | 033-2222740-2222748 033-3340101 | සහකාර ලේඛකාධිකාරී (ශිෂ්‍ය සේවා) Assistant Registrar (Student affairs) | 033-3340106 | ඊ මේල් E-mail | ayurgmp@sltnet.lk |

| | | |
|---|---|---|
| මගේ අංකය My Number | ඔබගේ අංකය Your Number | දිනය Date |

පීඩබ්ල්අයි/ඒසී4/විගණන - 2013 ඊසී/එෆ්/ජීඩබ්ල්අයි/1/13/10 2014.10.10

එච්.ඒ.එස් සමරවීර මහතා,
විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
අංක 306/72, පොල්දූව පාර,
බත්තරමුල්ල.

කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 (1) උපවගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

ඉහත සඳහන් වාර්තාව සම්බන්ධයෙන් මේ වන විට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳ අදහස් මෙසේ දක්වමි.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

1.3 විගණකගේ වගකීම

1.4 තත්වාගණනය කළ මතය සඳහා පදනම

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්වාගණනය කළ මතය

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

සේවක පාරිතෝෂික ප්‍රතිපාදන අරමුදලක් ඇති කිරීම සඳහා මුදල් ප්‍රමාණවත් නොමැති වීම හේතුවෙන් දැනට අරමුදලක් ගොඩනැගී නොමැත.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

(අ) විගණන වාර්තාවේ පෙන්වා දී තිබූ ඉඩම් හා මෝටර් රථයේ වටිනාකම් තක්සේරු කර ගිණුම් ගත කිරීමට කටයුතු යොදා ඇත.

(ආ) මූල්‍ය තත්ව ප්‍රකාශනයේ විශේෂිත අරමුදල් යටතේ සටහන් කර තිබූ ප්‍රත්‍යාගණන වටිනාකම වූ රු.141,060,834/- ක මුදල මූල්‍ය තත්ව ප්‍රකාශනයේ සංචිත යටතේ දැක්වීමට සටහන් කර ගෙන ඇත.

2.2.3 නොසැසඳූ පාලන ගිණුම්

මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කරන ලද ස්ථාවර වත්කම් උප ලේඛණය හා ස්ථාවර වත්කම් ලේඛණය අතර පැවති වෙනස්කම් මේ වන විට නිවැරදි කර ඇති අතර, එය යාවත්කාලීන කෙරෙමින් පවතී.

2.2.4 ගෙවිය යුතු ගිණුම්

(අ) ගෙවිය යුතු ඇප තැන්පත්

මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව වර්ෂ 03 - 05 දක්වා කාලයක සිට පැවත එන රු. 165,569/- ක් වූ රඳවාගැනීම් මේ වන විට නිරවුල් කිරීමට කටයුතු කර ඇත

(ආ) අයවිය යුතු නේවාසිකාගාර ගාස්තු

අයවීමට තිබූ හිඟ නේවාසිකාගාර ගාස්තු මේ වන විට රු. 239,540/- දක්වා අඩුකර ගැනීමට හැකි වී ඇත. එම මුදලින් රු. 113,980/- ක් දැනට සීමා වාසික පුහුණුව ලබමින් සිටින සිසුන්ගෙන් ද රු. 125,560/- ක් දැනට නේවාසික පහසුකම් ලබන සිසුන්ගෙන් ද අයකර ගැනීමට ඇති මුදල් වේ. සීමා වාසික සිසුන්ගෙන් අයකර ගැනීමට ඇති හිඟ මුදල් සහතික පත් නිකුත් කිරීමට පෙර අයකර ගැනීමට කටයුතු යොදා ඇති අතර, අනෙකුත් හිඟ මුදල් අයකර ගැනීමේ කටයුතු මේ වන විටත් සිදුවෙමින් පවතී.

2.2.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලසි වලට යොමුව

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ පරිච්ඡේදයේ 10.1 වගන්තිය, 1997 පෙබරවාරි 03 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/97

අධ්‍යයන සහකාර තනතුරු ගණයට වැටෙන පරිගණක උපදේශකවරුන් ආයතනයේ හදිසි අත්‍යාවශ්‍ය රාජකාරි කටයුතු සම්බන්ධයෙන් රජයේ නිවාඩු දින සේවයේ යෙදවීමට සිදුවන අතර, ඒ වෙනුවෙන් 199 වන කළමනාකරණ මණ්ඩල රැස්වීමේදී ගත් තීරණයකට අනුව ගරු දීමනාවක් ලෙස අදාල අයට ගෙවීම් සිදු කර ඇත.

(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා ආයතන සංග්‍රහයෙහි XX වන පරිච්ඡේදයේ 3 (1) වගන්තිය සහ X පරිච්ඡේදයේ 1.6. 1 වගන්තිය

අධ්‍යයන කාර්ය මණ්ඩල පැමිණීම සනාථ කර ගැනීම පිණිස පැමිණීමේ ලේඛනයක් පවත්වාගෙන යාමට අදාල අයට උපදෙස් ලබා දී ඇත.

(ඇ) 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය

සාමාන්‍ය රාජකාරි කටයුතු වලින් බැහැරව, ආයතනයේ ගාස්තු අයකර පවත්වනු ලබන පාඨමාලා කටයුතු සිදු කිරීම වෙනුවෙන්, ඒ ඒ රාජකාරි කටයුතු වල නිරත වන සේවක මහත්ම මහත්මීන්ට වෙනත් විශ්වවිද්‍යාලයන්හි අනුගමනය කරන ආකාරයට පාඨමාලා ඉපයීම් වලින් ගෙවීම් කිරීම ආයතනයේ මුදල් කමිටුව සහ කළමනාකරණ මණ්ඩලය විසින් අනුමත නිර්නායකයන්ට අනුකූලව සිදුවනු ඇත. එම ගෙවීම් සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ මහා භාණ්ඩාගාරය වෙත අදාල අනුමැතිය ලබා ගැනීම පිණිස ඉදිරිපත් කර ඇත.

(ඈ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය

ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීම සිදු කෙරෙමින් පවතී.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 අධ්‍යයන කාර්ය සාධනය

(ආ) අදාල විස්තර සැපයීමට කටයුතු කරනු ඇත.

(ආ) ඒක ශිෂ්‍ය පිරිවැය

ඒක ශිෂ්‍ය පිරිවැය අවම කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) ආයතනයේ ශාස්තු අයකර පවත්වාගෙන යනු ලබන පාඨමාලා ගෙවීම් කටයුතු සිදු කිරීම සඳහා වෙනත් විශ්වවිද්‍යාලයන්හි අනුගමනය කරන ආකාරයට පිළියෙල වී ඇති නිර්ණායක ආයතනයේ මුදල් කමිටුව සහ කළමනාකරණ මණ්ඩලය විසින් අනුමත කර ඇති අතර ඒ අනුව ගෙවීම් සිදු කර ඇත. එම නිර්ණායක වලට අනුකූලව එක් එක් පාඨමාලා සංවිධානය කිරීම වෙනුවෙන් එකී පාඨමාලා ඉපයීම් වලින් අනුමත අය වැය ඇස්තමේන්තු වලට අදාලව පාඨමාලා සීමාවකට යටත්ව පාඨමාලා සංවිධානය කිරීම සඳහා ගෙවා ඇති අතර . එම නිර්ණායක වලට අනුකූලව ගෙවීම් කිරීම සම්බන්ධයෙන් වි.වි.ප්‍ර.කො. සභාව සහ මහා භාණ්ඩාගාරය දැනුවත් කර ඇති බව දන්වමි.

(ආ) කෙරීගෙන යන වැඩ වට්ටෝරුව පැහැදිලිව වෙන් වෙන් වශයෙන් හඳුනාගත හැකිවන පරිදි ලේඛණයක් පවත්වාගෙන යන බව දන්වමි.

4.3 ඌණ උපයෝජිත අරමුදල්

(අ) NCAS ආයතනය විසින් පර්යේෂණ කටයුතු සඳහා ආයතනයේ ආචාර්යවරයෙකු වෙත ලබා දී තිබුණු රු. 2,061,450/- ක මුදලින් රු. 1,902,652/- ක් පර්යේෂණ කටයුතු වෙනුවෙන් වැය කර ඇත. ඉතිරි රු.158,798/- ක මුදල ගිණුම් පොත්වල ශේෂව පැවති අතර, එම මුදල නිබන්ධන කටයුතු වෙනුවෙන් ගෙවිය යුතු මුදලක් ලෙස පවතී.

(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ආයතනයේ ආචාර්ය මහත්මීන් දෙදෙනකුට ලබා දී තිබුණු රු.500,000/- පර්යේෂණ ආධාර මුදලින් ශේෂව පවතින මුදල් ඔවුන් විසින් මේ වන විට පර්යේෂණ කටයුතු සඳහා දරා ඇති වියදම් වෙනුවෙන් ගෙවීම් කිරීමට නියමිතය.

4.4 සේවක මණ්ඩල

මේ යටතේ දක්වා තිබූ අධ්‍යයන හා අනධ්‍යයන සේවක මණ්ඩල පුරප්පාඩු පිරවීමේ කටයුතු සිදු වෙමින් පවතින අතර විධායක මණ්ඩල සේවක පුරප්පාඩු මේ වන විටත් සම්පූර්ණ කර ඇති බව දන්වා සිටිමි.

5. ගිණුම් කටයුතුභාවය හා යහ පාලනය

5.1 ක්‍රියාකාරී සැලැස්ම

(අ,ආ,ඇ,ඈ) ආයතනයේ එක් එක් අංශවලට අදාල ක්‍රියාකාරකම් ක්‍රියාකාරී සැලැස්මේ ඒ ඒ අංශ යටතේ අඩංගු වී ඇති අතර එම ක්‍රියාකාරකම් බොහෝ දුරට අදාල වර්ෂය තුල සිදු කිරීමට කටයුතු කරනු ඇත. ඒ අනුව අපේක්ෂිත ක්‍රියාකාරකම් වලින් බොහොමයක් මේ වන විට සම්පූර්ණ කරගැනීමේ හැකියාව ලැබී ඇති අතර අනෙකුත් ක්‍රියාකාරකම් දැනටත් ක්‍රියාත්මක වෙමින් පවතී.

5.2 අයවැය ලේඛනමය පාලනය

අයවැය ලේඛනය කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කර ගැනිමට හැකි තරම් දුරට කටයුතු කරන බව දන්වා සිටිමි.

5.3 නොවිසඳී ඇති විගණන ඡේද පිළිබඳ නිරීක්ෂණ

ආයුර්වේද ශික්ෂණ රෝහල ආයුර්වේද දෙපාර්තමේන්තුවට පවරා ගැනීමේදී ශික්ෂණ රෝහල වෙනුවෙන් ආයතනය විසින් දරා තිබූ රු.1,940,161/- ක මුදල සම්බන්ධයෙන් ආයුර්වේද දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇත.

6. පද්ධති හා පාලනයන්

විගණනය විසින් දක්වා ඇති පද්ධති හා පාලන අඩුපාඩු හැකි තරම් දුරට අවම කර ගැනීමට විශේෂ අවධානය යොමු කරන බව දන්වා සිටිමි.

මහාචාර්ය ජනිතා ඒ. ලියනගේ
අධ්‍යක්ෂ

පිටපත්-
1. සභාපති - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
2. ලේකම් - උසස් අධ්‍යාපන අමාත්‍යංශය
3. ලේකම් - මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යංශය